# මාර්තු 12 ව්‍යාපාරයෙන් අලුත් වැඩක්

■ ඉන්දික හේවාවිතාරණ

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාවට සේවා සැලසිය යුත්තේ කෙසේද යන්න සහ මන්ත්‍රීවරයෙකු ලෙස ඉටු කළ යුතු අනිවාර්ය කරුණු පිළිබඳ කෙටුම්පතකට මේ මස 12 වැනිදා අත්සන් ලබාගන්නා බව මාර්තු 12 ව්‍යාපාරය සඳහන් කරයි.

දේශපාලන පක්ෂයක් අපේක්ෂකයන් තෝරාගැනීමේදී සලකා බැලිය යුතු නිර්ණායක පද්ධතියක් පසුගිය වසරේ මාර්තු 12 වැනිදා හඳුන්වාදුන් බවත්, ඒ අනුව කටයුතු කරන බවට සියලු දේශපාලන පක්ෂ ප්‍රසිද්ධියේ පොරොන්දු වූ බවත් එම ව්‍යාපාරයේ කැඳවුම්කරු රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

ඊයේ (07දා) පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී මේ බව කී කැඳවුම්කරු වැඩිදුරටත් සඳහන් කළේ මාර්තු 12 ව්‍යාපාරයේ කෙටුම්පතට අනුව යමින් පසුගිය මැතිවරණයේදී බොහෝ පක්ෂ අපේක්ෂකයන් තෝරාගත් බවයි. එයට පිටින් යමින් සමහර පක්ෂ අපේක්ෂකයන් තෝරාගැනීම සිදුකළ බවත්, එහෙත් ජනතාව විසින් ඉන් බොහෝ දෙනෙකු පරාජයට පත්කළ බවත් ඔහු පවසා සිටියේය.



ජනතාව පරජය කළ පිරිස් නැවත මහජන නියෝජිතයන් බවට පත් කරගැනීම සඳහා සමහර පක්ෂ කටයුතු කර තිබෙන බවත්, ඒ සඳහා එම පක්ෂ භාවිත කළේ විද්වතුන් සහ බුද්ධිමතුන්ට පාර්ලිමේන්තු යාම සඳහා ලබා දී තිබෙන ජාතික ලැයිස්තුව බවත් රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

එහෙත් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වළක්වාගැනීම සඳහා මාර්තු 12 ව්‍යාපාරය ලෙස ඉදිරියේදී වැඩපිළිවෙළක් සකස් කර ඉදිරිපත් කරන බවද ඒ මහතා පවසා සිටියේය.

මාර්තු 12 ව්‍යාපාරය ආරම්භ කර වසරක් පිරීම නිමිත්තෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාවට ඉටු කළ යුතු අනිවාර්ය සේවාවන් පිළිබඳව සහ මන්ත්‍රීවරයෙකු විසින් නිලකාලය තුළ අනිවාර්යයෙන්ම සිදුකළ යුතු කරුණු ඇතුළත් කෙටුම්පතක් මාර්තු 12 වැනිදා ප්‍රකාශයට පත්කරන බවත්, එම කෙටුම්පතට අනුව කටයුතු කරන බවට එදින නවක මන්ත්‍රීවරුන්ගෙන් අත්සන් ලබාගැනීමක්ද සිදුකරන බවත් ඔහු සඳහන් කළේය.

ඉන්පසුව ක්‍රම ක්‍රමයෙන් අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙන්ද කෙටුම්පතට අනුව කටයුතු කරන බවට අත්සන් ලබාගන්නා අතර, කෙටුම්පතට අනුව කටයුතු කරන මන්ත්‍රීවරුන් පිළිබඳව සමාජය දැනුවත් කිරීම සඳහා මාර්තු 12 වැනිදා වෙබ් අඩවියක් විවෘත කරන බවද රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

මන්ත්‍රීවරුන් අත්සන් කරන කෙටුම්පත පිළිබඳව අද (08දා) නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින්ම මාධ්‍යයට ප්‍රකාශ කිරීමට සැලසුම් කර තිබෙන බවද ඔහු කියා සිටියේය.

මෙම කෙටුම්පත තුළ අල්ලස, දූෂණයෙන් තොරව කටයුතු කිරීම, වචන භාවිතයේදී නිවැරදි ආකාරයට කටයුතු කිරීම, ජනතා සේවය සිදු කිරීමේදී සැබෑ ජනතා අවශ්‍යතා කුමක්ද යන්න තේරුම්ගෙන වැඩ කටයුතු කිරීම සහ නිවැරදි ලෙස වත්කම් බැරකම් ප්‍රකාශ නිකුත් කරන බව යන කරුණු ඇතුළුව තවත් කරුණු ගණනාවක් ඇතුළත් බවද හෙතෙම සඳහන් කළේය.